

20

# මහාසාර පලඳනාව

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මනමේ, සිංහබාහු, පේමතෝ ජායතී සෝකෝ, කදා වළලු, වෙල්ල වැහුම්, එලොව ගිහින් මෙලොව ආවා, පබාවතී, මහාසාර ආදි නාට්‍ය ගණනාවක් ම සිංහල නාට්‍ය කලාවට දායාද කර ඇත. දේශීය නාට්‍ය කලාවක් සඳහා පදනම සකස් කිරීම එතුමා ඉටු කළ සුවිශේෂ කාර්යයකි. ඒ සඳහා දේශීය ගැමි නාටක මෙන් ම පෙර'පර දෙදිග නාට්‍ය ද විධිමත්ව හැදෑරීම බෙහෙවින් ඉවහල් වූ බව පෙනේ. සාහිත්‍ය විචාර කලාව ඇතුළු අංශ ගණනාවක එතුමාගේ දායකත්වය කැපී පෙනෙයි.

පැරණි කතා පුවතක් පදනම් කොට ගත්ත ද එමගින් නව මානයකින් සමාජය දෙස බැලීමට ප්‍රේක්ෂකයා යොමු කිරීම සරච්චන්ද්‍රයන්ගේ බොහෝ නාට්‍යවල ප්‍රධාන ලක්ෂණයකි. මහාසාර නාට්‍යය, මහාසාර ජාතක කතාව ඇසුරෙන් කළ හාස්‍යෝත්පාදක නිර්මාණයකි. මෙහි ඇතුළත් වන්නේ ඒ නාට්‍යයෙන් උපුටා ගත් කොටසකි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**1 වැනි අංකය**

(වැඳිරියක් පිවිස ඉඟි බිඟි කොට නොයෙක් උසුළු විසුළු පාමින් තමා පැලඳි මුතු මාලයක් ප්‍රේක්ෂකයන්ට පෙන්වා ඕජෝ වඩමින් නටයි.)

වැඳිරිය:

සබේ සිටින මහතුනි හැම
ඔබට ආයුබෝවන්! මට
හිතන්න බෑ ඔබට මාව
අඳුනගන්න බැරිය කියල.
ඔව් ඔව් ඔබ හිතනව හරිඃ
ඇයි සැකයක් පහළ වෙන්නෙ?
මං නම් වැඳිරියක් තමා,
ඇයි ඒකට ලැජ්ජ වෙන්නෙ?
වෙනත් නැද්ද වැඳිරියො ලොව?
වෙනත් ලෝකෙ වැඳිරියො වගෙ
මමත් කැමති දෙයක් තමා
හොඳට පැලඳගෙන අබරණ,
ලා ගෙන පට දුහුල් වස්ත්‍ර,
විලවුන් ගල්වා සුවඳැති,
උජාරුවට සැරසීගෙන
බොහොම රුවට පෙනී ඉන්ට.
කොයි වැඳිරි ද කැමති නැත්තෙ
ලා ගෙන පට දුහුල් වස්ත්‍ර
විලවුන් ගල්වා සුවඳැති
බොහොම රුවට පෙනී ඉන්ට?
කොයි වැඳිරිය වුණත් ලෝකෙ
හැඳ ගත්ත ම දුහුල් වස්ත්‍ර,
ලා ගත්ත ම මුක්තහාර,
වෙනත් පලඳනා අපමණ,
විලවුන් ගල්වා ගත්ත ම,
බෙහොම රුවට හැඩ ගැහෙනව,
බොහොම ලකේටත් පෙනෙනව.

ගායක කණ්ඩායමඃ

කොයි වැඳිරිය වුණත් ලෝකෙ
හැඳ ගත්තම දුහුල් වස්ත්‍ර,
ලා ගත්ත ම මුක්තහාර,
වෙනත් පලඳනා අපමණ,

විලවුන් ගල්වා ගත්ත ම,
බොහොම රුවට හැඩ ගැහෙනව
බොහොම ලකේටත් පෙනෙනව.

| | |
|---|---|
| වැදිරිය: | බලන්න මේ පලඳනාව |
| (කරේ පැලඳි මාලය | ඇන්ද ම මගෙ තියන එළියඃ |
| පෙන්වමින්) | හරි ම රාජ කුමාරියක්! |
| | මාව දැක්කොතින් කවියෝ |
| | සින්දු හදා රට පුරාම |
| | යාවි ගායනා කර කර. |
| | රාජ කුමාරයොත් ඒවි |
| | මාගෙ වර්ණනාව අසා |
| | මාව සරණ පාව ගන්න. |
| (කැඩපතක් ගෙන | කන්නාඩියෙ මූණ බලා |
| මූණ බලා) | ඒ ගැන මම මවිත වෙනව, |
| | හඳුනන්නත් බැරි තරමයි |
| | මේකෙ ඉන්නෙ මං ද කියල. |

ගායක කණ්ඩායමඃ කොයි වැදිරිය වුණත් ලෝකෙ
......................................................

(නේපථ්‍යයෙහි අණබෙර හඬක් ඇසේ)

වැදිරියඃ රජ්ජුරුවන්ගෙ අණබෙරකාරයා නේද? මොකක් ද මේ හදිසි නිවේදනය? යුද්ධයක් වත් ද? නැත්නම් කැරැල්ලක් ද? ඔය විදිහට අණබෙර ගහන්නෙ නම් මොකක් ද භයානක තත්ත්වයක් පැන නැඟිලයි. මමත් මේ ගස් මුදුනේ ඉඳන් ඕව අහල තියෙනව නෙ, අවුරුදු පහළොවක් විස්සක් මුළුල්ලෙ. අනේ මට නං ඕන නෑ ඕවට පැටලෙන්න. මම යනව යන්න, මගේ පුරුදු වාසබවනෙට.

(අණබෙරකරුවෙක් පිවිසේ)

අණබෙරකරුඃ අපේ මහරජාණන් වහන්සේගේ අණ පරිදි දන්වන වග නම් - සතුරු බියෙන් සොර බියෙන් දීර්ඝ කාලයක් මුළුල්ලේ රට වැසියන් ආරක්ෂා කර ගෙන දැහැමින් සෙමෙන් රාජ්‍ය කළා වූ අප මහරජාණන් වහන්සේට ද්‍රෝහිව උද්ගත වී සිටින කිසියම් සතුරු පක්ෂයක් විසින් කරන ලද මහා භයානක අපරාධයක් නිසා අග්‍රමහේසිකාවන් වහන්සේ ඇතුළු මුළු අන්තඃපුරයත් රාජ මාලිගාවත් අතිශයින් කැලඹීමට පත් වී සිටිනවා ය. ඒ කුමක් හෙයින් ද යත්ඃ අප මහරජාණන් වහන්සේගේ අග්‍ර

මහේසිකාවන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රාණය මෙන් ආරක්ෂා කරන්නා වූ මහාසාර පලඳනාව නම් මුතු මැණික් ඔබ්බවා ගනරනින් සාදන ලද ඉතා අගනා ආභරණය, නිර්භය වූ නිර්ලජ්ජී වූ චෞරයෙකු විසින් සොරකම් කර තිබෙනවා ය. ඒ නිර්ලජ්ජී වූ චෞරයා අල්වා තමන් වහන්සේ ඉදිරියට ගෙන එන්නා වූ කෙනෙකුට මහරජාණන් වහන්සේ දහසක් බැඳි පියල්ලක් දෙන බව ද තවත් තාන්න මාන්න වතුපිටි ඉඩකඩම් ගව මහිෂාදි සම්පතුත් ප්‍රදානය කරන බව ද දන්වා වදාරන සේක... (නික්ම යයි)
(නේපථ්‍යයෙහි "හොරා අල්ලපියව්" "හොරා අල්ලපියව්" යන හඬින් කීප දෙනෙකු කෑ ගසනු ඇසේ. ත්‍රස්ත වූ විලාසයක් පාමින් ගැමියෙක් ශීඝ්‍රව පිවිසේ)

ගැමියා: මං නම් අද පිටත් වෙච්ච නැකත හොඳ නෑ. අද මුළු නගරෙම මහ කලබලයක්. කවදාවත් නැති විදිහට ඔක්කොම මිනිස්සු කෑගහනව, අල්ලපියව් හොරා, අල්ලපියව් හොරා කිය කියා. රාජපුරුෂයො වගයක් මා දිහාත් බැලුව අමුතු විදිහකට. මට හරියට බය හිතුණා. මම පුළුවන් ඉක්මනට ආපහු ගමට ගියොත් තමා හොඳ. මගෙ වැඩපළ ටික නම් කරල ඉවර කරගන්න බැරි වුණා. ඒ වුණත් ඒකට වෙන දවසක එන්න බැරිය? අද නං මගේ හිත කියනව මෙහෙ තවත් ඉන්න එපයි කියල. අන්න රාජපුරුෂයො දෙන්නෙකුත් එනව මේ පැත්තට. මං ඉක්මන් කරල ගියොත් හොඳයි.
(ඉක්මනින් යන්ට පටන් ගනී. රාජපුරුෂයෝ දෙදෙනෙක් පිවිස ඔහු දකිති)

1 රාජපුරුෂයා: අන්න අර දුවන මිනිහ වෙන්න ඕන.

2 රාජපුරුෂයා: ඔව්, ඔව්, උන්දැ වෙන්න ඕන. අල්ලපියව්! නැවතියන්! නැවතියන්! වහා නැවතියන්!

1 රාජපුරුෂයා: වහා නැවතියන් (දෙදෙනා ගැමියා ලුහුබැඳ අල්වා ගනිති)

1 රාජපුරුෂයා: හඃ! හඃ! හඃ! උඹ දුවල බේරෙන්න හදනව නේ ද? උඹ හිතන්නෙ උඹට ඔහොම ගැලවෙන්න පුළුවන් කියල ද?

2 රාජපුරුෂයා: මේ මිනිහව තමයි මං දැක්කෙ එක පාරකුත්. මට හිතුණා උන්දැ වෙන්න ඕනෙයි කියල හොරා.
(ගැමියා පිටිතල හයා බැඳ තළයි)

| | |
|---|---|
| ගැමියාඃ | අනේ රාලහාමි, මට තළන්නේ නැතුව යන්න දෙන්න. මං මේ පොඩි ගනුදෙනුවකට නගරෙට ඇවිල්ල ආපහු යන ගමන්. |
| 1 රාජපුරුෂයාඃ | හඃ! හඃ! හඃ! පොඩි ගනුදෙනුවක්, ආ? අගබිසවුන් වහන්සෙගෙ මහාසාර පලඳනාව හොරකම් කරගෙන යන එක පොඩි ගනුදෙනුවක්. ඒ වචනෙටම මූ උල තියන්න වටිනව නෙ. |
| 2 රාජපුරුෂයාඃ | කෝ දිය තෝ ගත්ත මහාසාර පලඳනාව. බඩුත් එක්ක හොරා අල්ලල දුන්නොත් තමා වඩාත්ම හොඳ. |
| ගැමියාඃ | අනේ රාලහාමි, මං නං දන්නෙ නෑ මහාසාර පලඳනාව කියන්නෙ කොයි වගෙ එකක් ද කියලවත් මං ඒ වචනෙ ඇහුවෙත් අදයි. |

රාඃ පුඃ දෙදෙනා (ගයමින්)

හඃ! හඃ! හඃ! දන්නෙ නැති ලු
මහාසාර පලඳනාව
කොයි වගේ එකක් ද කියල!
අහල නැතිලු කවදාවත්
මහාසාර කියන වචනෙ!
එහෙනං තෝ මොට ද ගත්තෙ?
ගමට ගොහින් දැන ගන්න ද
හොර අඹුවගේ කරේ දාලා
කොයි වගේ එකක් ද කියල?
මහරජ්ජුරුවන් ඉදිරියෙ
කියාපිය ඔය බින්න ගොහින්!
අපට මොට ද ඕව කියල?
අපේ නෙවේ පලඳනාව,
අයිතිකාරි අග බිසවයි.
හොරකම තොගෙ හංගගන්න
කියපිය තව බින්න හදා.

1 රාඃ පුඃ

කියපිය තෝ පලඳනාව
ගත්තෙ නැතෙයි කියලා බොලේ,
ගත්තෙ වෙන කෙනෙක් ය කියලා
නැත්තන් තොට ගැලවෙන්නට
විදිහක් නෑ හම්බ වෙන්නෙ.

දෙදෙනා මඃ තෝව උල තියා මරාවි
නැත් නම් පෙති ගහල දාවි,
කඳන් දෙකක් මැදින් තෝව
බැඳල ඉරල දාවි දෙකට.
දහසක් වද විඳල තමයි
තොට මරණෙට යන්න වෙන්නෙ.

1 රා. පුඃ නැත් නම් බොල කියපිය තෝ
කවුද හොරෙන් ඇවිත් ඒක
හොරෙන් අරන් යනව දැකල
තෝ ගොහිල්ල උදුරාගෙන
අගබිසවට දෙන්න කියල
ගේන අතර පලඳනාව
අහසට ඉගිලිලා ගිහින්
අතුරුදහන් වුණයි කියලඃ
අනුහස් ඇති මහාසාර
පලඳනාව අග බිසවගෙ,
එවැනි හාස්කම් කරන්න
බැරි බඩුවක් නෙවේ ඒක.

දෙදෙනාඃ කියපිය තව බින්න හදා
මහරජ්ජුරුවන්ට ගොහින්,
නැත්නම් තොට විදිහක් නෑ
බේරෙන්නට කොහොම වුණත්,
දහසක් වද විඳල තමයි
තොට මරණෙට යන්න වෙන්නෙ.
(ගැමියා රැගෙන නික්ම යති)

ගායක කණ්ඩායමඃ තෝව උල තියා මරාවි
නැත්නම් පෙති ගහල දාවි
කඳන් දෙකක් මැදින් තෝව
බැඳල ඉරල දාවි දෙකට
දහසක් වද විඳල තමයි
තොට මරණෙට යන්න වෙන්නෙ.
(රජ සහ බිසව පිවිසෙති)

බිසව: ඔබ වහන්සේත් ළඟ ම ඉන්දැද්දි මගේ පලඳනාව හොරකම් කරගෙන ගිය එක නෙ කාරණාව. ඔබ වහන්සෙට දැන් කිසි කෙනෙක් බය නෑ මේ රටේ. නැත් නම් ඇස් ඉදිරියෙ, මේ හද්ද දවල් ඔහොම එකක් කරාවි ද?

රජ: උන්දැව මං පෙති ගහනව හතරමං හන්දියෙ තියල. හැමෝට ම පේන්න. අනික් අයටත් පාඩමක් ඉගෙන ගන්න.

බිසව: කොයි දේ කෙරුවත් පලක් නෑ මගේ පලඳනාව සොයා ගත්තොත් මිස චරපුරුෂයො ඉන්නව කියනව හැම තැන ම. රැකවල්ලු අපිව වට කරගෙන ලු. කෝ ඉතින් වැඩක් උණා ය? අනික් පාර අපිවත් උස්සගෙන යාවි.

රජ: උන්දලව මම උල තියනව ඔක්කොම, පලඳනාව හොයල දුන්නෙ නැත් නම්. උන්දල හිතන්නෙ මාව රවට්ටන්න පුළුවන් කියල. උන්දල දන්නෙ නෑ මගේ විත්තිය.

බිසව: ඔබ වහන්සෙ ටිකක් වත් සෝදිසියෙන් හිටිය නම් ඔහොම දෙයක් වෙන්නෙ නෑ. කවුද දන්නෙ මුරකාරයො ම ද කියල? ඔබ වහන්සෙ ක්‍රීඩාවට ගියා ම වෙන කිසි දෙයක් ගැන කල්පනාවක් නැති බව උන් දන්නව - වැඩියෙන් ම පුරාංගනාවො ඉන්නකොට. (සේවකයෙක් පිවිසේ)

සේවකයා: ජය වේවා රජතුමනි! අගබිසවුන් වහන්සෙගෙ මහාසාර පලඳනාව සොරකම් කරපු මිනිහ රාජ පුරුෂයින්ගෙ අතට පත්වෙල තියෙන බව දැනුම් දෙන්න කැමතියි, දේවයන් වහන්ස. ඔබ වහන්සෙගෙ කැමැත්ත දන්වනු යෙහෙකි.

රජ: (සතුටු මුහුණින් යුතුව බිසවට) මම කිව්වා නේද පලඳනාව හොයල දෙනවයි කියල වැඩිකල් යන්න ඉස්සර? මගේ රාජ්ජයෙ ඔහොම හොරකමක් කරල කොහොම ද මිනිහෙක් බේරෙන්නෙ? (සේවකයාට) හොරා වහා අධිකරණයට ගෙන එව.

සේවකයා: හොරා අධිකරණ ශාලාවට දැන් ගෙන යනව ඇති දේවයන් වහන්ස. ඔබ වහන්සේ මෙහෙන් යහපත් වනු මැනවි.
(පරික්‍රමණය කරමින්)

රජ: මම අද මේ නඩුව අහන්නෙ මහේසිකාවුන් වහන්සෙත් සමගයි. අප දෙදෙනාට ම අසුන් පනවනව හොඳයි.
(සේවකයා නික්ම ගොස් අසුන් දෙකක් ගෙනවිත් තබයි)

බිසව: මගෙ හිත නං කියනව ඔය පලඳනාව ආයෙමත් හම්බ වෙන්නෙ නෑ කියල.

රජ: ඇයි එහෙම කියන්නේ, සොඳුර?

බිසව: දැන් අපට පක්ෂ නෑ මේ රටේ කිසි කෙනෙක්. ටික කලක් හිටන් මට ඒක තේරුණා.
(රජු සහ බිසව අසුන් ගත් පසු පළමු කී රාජ පුරුෂයෝ දෙදෙන ගැමියා අල්ලා ගෙන අධිකරණයට පිවිසෙති)

රජ: මහාසාර පලඳනාව ගත්ත හොරා ද මේ?

1 රාඃ පුඃ එහෙමයි දේවයන් වහන්ස.

රජ: මගේ රටේ වැසියෙක් තමාගේ රටේ රජ කරන රජ්ජුරුවන්ගෙ, අග්‍ර මහේසිකාවගෙ ආභරණයක් හොරකම් කරනව? එහෙම එකක් කවදාවත් අහලා තියෙනව ද? වෙන කෙනෙකුගෙ දෙයක් හොරකම් කෙරුව නම් කමක් නෑ. නමුත් රජ්ජුරුවන්ගෙ දේ? මහේසිකාවගෙ දේ? තමන්ගෙ දේ තමන් ම හොරකම් කෙරුව වගේ නෙ. (ගැමියාට) අග්‍ර මහේසිකාවුන් වහන්සෙගෙ මහාසාර පලඳනාව බව දැනගෙන ද මේ හොරකම කෙළේ?

බිසව: දැනගෙන නේන්නම් හොරකම් කරන්නේ? මහාසාර පලඳනාවක් වෙන කාට වත් තියෙනවය, මට ඇරෙන්න?

රජ: ඒක තමයි, සොඳුර, මම ඇහුවෙ. ඒ බව දන්නෙ නැත් නම්, ඒකටත් දඬුවම් කරන්න ඕන වෙනම ම, හොරකමට විතරක් නෙවේ. (ගැමියාට) මගේ ප්‍රස්නෙට පිළිතුරු දෙව.

ගැමියා: එහෙමයි දේවයන් වහන්ස.

රජ: මොනව ද එහෙමයි කියන්නෙ? අග්‍ර මහේසිකාවුන් වහන්සෙගෙ පලඳනාව බව දැනගෙන ද නැද්ද?

ගැමියා: නෑ දේවයන් වහන්ස.

රජ: නෑ කියන්නෙ, දන්නෙ නැතුව හොරකම් කෙරුවයි කියන එක ද?

ගැමියා: නෑ. දේවයන් වහන්ස.

රජ: එහෙනම් දැනගෙනයි හොරකම් කරල තියෙන්නෙ.

ගැමියා: එහෙමත් නෙවේ, දේවයන් වහන්ස.

රජ: මොනව ද මේ මිනිහා දොඩවන්නෙ? කෙළින් උත්තර දෙන්න බැරි ද අහන ප්‍රස්නෙට?

ගැමියා: (හඬමින්) අඟහරුවාද දවසක හඳ දැක්කොත් මොනව හරි විපත්තියක් මට වෙනව වෙනවමයි. මම ඒක කීප වතාවක් බලල තියෙනව.

රජ: ආයෙමත් අනං මනං දොඩනව. අහන එක තේරෙන්නෙ නැද්ද? තමා කොයි පළාතෙ මිනිහෙක් ද?

ගැමියා: මම බොහොම කලාතුරකින් මේ පැත්තෙ එන්නෙ, දේවයන් වහන්ස. අදත් මම එන්න නෙවේ හිටියෙ. ගෙදර උන්දැගෙන් බේරෙන්න බැරුවමයි මම ආවෙ. උන්දැ නිතරම කියනව, නගරෙට ගිහිල්ල මස්මාංස ටිකක් ගෙනෙන්, හැමදාම අපට කරවල කකා ඉන්න පුළුවන් ද කියල.

බිසව: (සිනාසෙමින්) මොකට ද ඔය ඕන නැති ප්‍රස්න අහන්නෙ? රජතුමා මේ වැඩේ මට බාර දීල නිස්සබ්දව ඉන්නව නං මට පුළුවන් මීට වඩා හොඳට යුක්තිය විසඳන්න.

රජ: නෑ සොඳුර, මම දැන ගන්න හැදුවෙ, මේ හොරකම තනියෙන් කරපු එකක් ද නැත්නම් හොර මුලක් විසින් කරපු එකක් ද කියලයි. මින් මත්තට මෙහෙම දේවල් නොවෙන්න වග බලා ගන්න එපාය? (ගැමියාට) හොඳයි, නගරෙට ආවම මෙහේදි කවුරුහරි හම්බ වෙනව ද?

බිසව: හොරාගෙන් අහනව ද ඕව? ඒ මිනිහ නිදහස් වෙන්න බොරු කියනව මිසක්, ඇත්ත කියාවි ද?

| | |
|---|---|
| රජ: | තා බොරු කිව්වොත්, තට කවදා වත් නිදහස ලැබෙන්නෙ නෑ. තගේ කට පුලුස්සනව රත් කරපු යකඩෙකින්. |
| බිසව: | එහෙනම් ඇත්ත කිව්වොත් හොරාව නිදහස් කරනව ද? හොරකමට දඬුවමක් නැද්ද? |
| රජ: | නෑ, සොඳුර (ගයමින්)<br>ඇත්ත කිව්වත් දෙනව දඬුවම්,<br>බොරුව කිව්වත් දෙනව දඬුවම්,<br>කියන විදියට දෙනව දඬුවම් -<br>උල තියාලා මරල දමමු ද?<br>දෙකට ඉරලා මරල දමමු ද?<br>ගිනි තියාලා මරල දමමු ද?<br>නැත්තං උණු තෙල් හැළියක දාලා<br>පණ තියෙද්දි ම මරල දමමු ද? |
| ගායක කණ්ඩායම: | ඇත්ත කිව්වත් බොරුව වාගෙයි.<br>බොරුව කිව්වත් ඇත්ත වාගෙයි.<br>කොයි දේ කිව්වත් කොහොම ද දන්නේ<br>ඇත්ත ද බොරුව ද කියල කියන්නේ?<br>උල තියාලා මරල දැම්මත්<br>ගිනි තබාලා මරල දැම්මත්<br>පණ තියෙද්දි ම මරල දැම්මත්<br>කොහොම ද ඇත්ත ද කියල හොයන්නේ?<br>කොහොම ද බොරුව ද කියල හොයන්නේ? |
| රජ: | (ගැමියාට) මගේ ප්‍රශ්නෙට කෙළින් පිළිතුරු දෙව. |
| ගැමියා: | අද මං පිටත් වෙන කොට, දේවයන් වහන්ස, හූනෙකුත් ඇඬුව. ඒත් මං ටිකක් නැවතිල ඉඳලයි ආවෙ. |
| රජ: | මේ මිනිහ මහ මෝඩයෙක් නෙ. අහල කිසි දෙයක් දැනගන්න බෑ. |
| බිසව: | ඔය වටින් පිටින් දොඩන්නෙ, මෝඩකමට නෙවේ. කපටිකමට. |
| රජ: | රාජ පුරුෂයිනි, මේ හොරාව අහු වුණෙ කොහොම ද කියල මට විස්තර කරවු. |

2 රාඃ පුඃ | අපි මුර තියාගෙන ඉන්න කොට ඇහුණ දේවයන් වහන්ස. අග බිසවුන් වහන්සෙගෙ දාසිය කෑගහනව, හොරා අල්ලපියවු, හොරා අල්ලපියවු කියල. ඒ පාර අපි දුවගෙන ගිහිල්ල හැම තැන ම හෙව්ව. වැඩි වෙලාවක් යන්න ඉස්සෙල්ල අපට අහු වුණා හොරා හැංගිල පැනල යන්න හදනවා.

බිසවඃ | දාසිය දැක්කා නෙ, සියැසින් ම, සිද්ද වෙච්ච දේ. ඔබතුමාට සැකයක් තියෙනව නම් දාසියගෙන් අහල බලන්න, හොරාගෙන් අහන්නෙ නැතුව.

රජඃ | රාජ පුරුෂය, දාසිය මෙහාට කැඳවාගෙන එව.
(රාජපුරුෂයෙක් නික්ම යයි)
සොඳුර මට කිව්වෙ නෑ නෙ දාසියගේ විත්තියක්.

බිසවඃ | ඇයි නැත්තෙ? මං කී සැරයක් කිව්ව ද? ඔබතුමා නෑනෙ මං කියන දෙයක් හරියට අහගෙන ඉන්නෙ. ඔබතුමන්ගෙ හිත හැම තිස්සෙ ම වෙන දිහාවක.

රජඃ | මේ ආරංචිය ඇහුවම මම කොච්චර කලබල වුණා ද කිව්වොත් සොඳුර කියපු දේත් තේරුණේ නෑ.
(රාජපුරුෂයා දාසිය සමග එයි)
දාසිය, තිගේ අතින් කොහොම ද මහාසාර පලඳනාව නැති වුණේ.

දාසියඃ | පලඳනාව කවුද හොරෙක් ඇවිල්ල උදුර ගෙන ගියා, දේවයන් වහන්ස.

රජඃ | උදුරගෙන ගියා? ඉතින් මොක ද උදුරගෙන යන්න ඉඩ දුන්නෙ?

දාසියඃ | කොහේ හරි හැංගිල ඉඳල එන්න ඇති, දේවයන් වහන්ස. එක පාරට ම ඇවිල්ල මට ගහල උදුරගෙන ගියා.

රජඃ | ඉතිං මොක ද තී කෙරුවෙ?

දාසියඃ | ඉතිං මම කෑගැහුව. එතකොට රාජපුරුෂයො ඇවිල්ලා මිනිහව හොයන්න පටන් ගත්ත.

රජඃ | ඒ මිනිහව තිට අඳුනන්න පුළුවන් ද?

| | |
|---|---|
| දාසියඃ | පුළුවන්, දේවයන් වහන්ස. මම හොඳට දැක්ක. |
| රජඃ | ඒ මිනිහ දැන් මෙතන ඉන්නව ද? |
| දාසියඃ | (වටපිට බලා) ඉන්නව දේවයන් වහන්ස. අන්න අර මිනිහ තමයි. |
| රජඃ | හොඳයි, දැන් දාසියට යන්න පුළුවන්.<br>(බිසවට) සොඳුර, නියම කරන්න දඬුවම. සොරාව සොයා ගත්ත නෙ. |
| බිසවඃ | ඉස්සෙල්ල මගේ පලඳනාව ඕන.<br>(සියලු දෙනා ම අන්දුන් කුන්දුන් වී උඩ බිම බලති) |
| 2. රාඃ පුඃ | පලඳනාව අපට හම්බ වුණේ නෑ, දේවයන් වහන්ස. |
| රජඃ | මොනව? පලඳනාව හම්බ වුණෙ නෑ? මොනව ද මෙච්චර වෙලා කෙරුවෙ? |
| 1 රා. පුඃ | හොරා ඒක කොහෙ හරි හංගලා වෙන්න ඇති දේවයන් වහන්ස. අපි ඉල්ලුව ම අපට දුන්නෙ නෑ. |
| රජඃ | (ගැමියාට) තෝ ගත්ත පලඳනාව කොහේ ද? තියපු තැනකින් වහා ගෙනවිත් දිය. |
| ගායක කණ්ඩායමඃ | බොරුව තමයි ජය ගන්නේ<br>අබුද්දස්ස කාලෙ අපේ කවුද ඇත්ත අදහන්නේ?<br>බොරුව වැඩිය රසවත් නේ.<br>ඇත්ත කියල මේ කාලේ<br>කාට ද බොල හරියන්නේ? |
| ගැමියාඃ | පලඳනාව මම වෙන කෙනෙකුට දුන්න, දේවයන් වහන්ස. |
| රජඃ | කාට ද? |
| බිසවඃ | මං කිව්ව නෙ පලඳනාව ආපහු මට ලැබෙන්නෙ නෑ කියල. ඔච්චර තමයි මේ නඩු විබාගෙ පලේ. |

රජ: ටිකක් ඉවසාගෙන ඉන්න සොඳුර. මේක බොහොම වැදගත් කරුණක්. මං දැනගත්ත මේ හොරකමට තනිකර හොරෙක් නෙවෙයි, හොර මුළුවක් ම ඉන්න පුළුවන් කියල. කාට ද දුන්නෙ පලඳනාව?

ගැමියා: මම පලඳනාව යසවඩ්ඪන සිටුතුමාට දුන්න, දේවයන් වහන්ස.

රජ: යසවඩ්ඪන සිටුතුමාට? මේ අපේ යසවඩ්ඪනයට?

ගැමියා: එහෙමයි රජතුමාණෙනි.

රජ: ඒ මොකට ද?

ගැමියා: යසවඩ්ඪන සිටුතුමා තමයි මට කිව්වෙ පලඳනාව හොරකම් කරල දෙන්නෙයි කියල.

රජ: ඒක වෙන්න බැරි දෙයක්.

බිසව: මගේ කවදාවත් වැඩි විස්වාසයක් තිබුණෙ නෑ ඔය යසවඩ්ඪන සිටුතුමා ගැන, රජතුමා ලොකුවට විස්වාස කෙරුවට මොක ද? දැන ගත්ත ඔය මිනිහ මහ කපටියෙක් බව, නිතර ම මාලිගාවේ දැවටි දැවටි.

රජ: (රාජපුරුෂයින්ට) යසවඩ්ඪන සිටුතුමා මෙහාට වහා කැන්දන් එව. (රාජපුරුෂයෙක් නික්ම යයි.)

රජ (ගයමින්)

කුමක් ද දේවිය සිදු වී ඇත්තේ?
ඇදහිය හැකි ද මෙ අරුම පුදුම දේ?
අප හා කුලුපග යසවඩ්ඪනයා
මෙතරම් නීච වූ වැඩක් කරාවි ද?

බිසව:

මේ කාලේ බෑ කිසි ම කෙනෙක් ගැන
විශ්වාසය ඇති කර ගෙන ඉන්නට,
දිව අග මී පැණි හිත යට වස විස
අහල නැද්ද පඬිවරුනගෙ ඒ බස්?

රජ:

වස්තුව නැතුවට දෙෝ යසවඩ්ඪන
නින්දිත ලෙස සොරකමට බසින්නේ?
අබරණ නැතුව ද උන්දැගෙ බිරිඳට
අනුන්ගේ දේට ම ලෝබ කරන්නේ.

බිසව:

වස්තුව වැඩි වෙන කොට තණ්හාවත්
වැඩි වෙන බව නෙව කියා තිබෙන්නේ
අබරණ කොපමණ තිබුණත් කෙනෙකුට
අනුන්ගෙ දේට ම ආසා වෙන්නේ

## අවබෝධය

1. රාජපුරුෂයන් ගැමියා සොරා ලෙස අනුමාන කිරීමට හේතු වූයේ කුමක් ද?
2. ඔබ සිතන අයුරින් රජ බිසවගේ මහාසාර පලඳනාව සොරා ගන්නා ලද්දේ කවුරුන් විසින් ද?
3. ඉහත නාට්‍ය කොටසෙහි ඇති නාට්‍යෝචිත අවස්ථා දක්වන්න.
4. මේ නාට්‍ය කොටසෙහි හාස්‍යය ඉස්මතු වන තැන් විස්තර කරන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. ඉහත නාට්‍ය කොටස පන්ති කාමරය තුළ රඟ දක්වන්න.
2. මෙහි ඉදිරිපත් කර ඇත්තේ 'මහාසාර' නාට්‍යයේ ආරම්භක ජවනිකා කීපයක් පමණි. මේ නාට්‍ය පිටපත පොතක් සේ මුද්‍රණය වී ඇත. එය කියවා රස විඳින්න.
3. මහාසාර හෝ වෙනත් වේදිකා නාට්‍යයක් හෝ නරඹන්න.



# අපිත් නාට්‍යයක් රචනා කරමු

ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ප්‍රසන්නජිත් අබේසූරිය
සෞන්දර්ය විශ්වවිද්‍යාලය

නාට්‍යයක් යනු කුමක් දැයි යන්නට දිය හැකි ඉතා සරල ම පිළිතුර වන්නේ යමක් කර පෙන්වීම යන්න ය. එහෙත් එය වඩා ගැඹුරින් විග්‍රහ කිරීමේ දී පහත සඳහන් ලෙස අර්ථකථනය කළ හැකි ය.

> "නාට්‍ය රචකයකු විසින් ලියන ලද නාට්‍ය පෙළක් හෙවත් පිටපතක් පාදක කර ගනිමින් නාට්‍ය අධ්‍යක්ෂවරයකු රංගන ශිල්පීන් ප්‍රමුඛ සෙසු ආනුෂංගික ශිල්පීන් දායක කර ගනිමින් නිශ්චිත රංග භූමියක් මත ප්‍රේක්ෂක පිරිසකගේ රස නිෂ්පත්තිය උදෙසා ඉදිරිපත් කෙරෙන රංග කාර්යය නාට්‍ය නම් වේ."

මෙම අර්ථකථනයේ වඩාත් ම වැදගත් තැනක් හිමි වන්නේ නාට්‍ය පෙළ හෙවත් නාට්‍ය රචනයට හෝ නාට්‍ය පිටපතට ය. ඉන් පැහැදිලි වන්නේ නාට්‍යයක මූලික පදනම වන්නේ නාට්‍ය පිටපත බව යි.

නවකතාවක්, කෙටිකතාවක් හෝ වෙනත් සාහිත්‍ය නිර්මාණයක් මෙන් නොව නාට්‍ය රචනාවක් යනු පාඨකයකු සඳහා ලියන්නක් නොවේ. නාට්‍ය පිටපතක් කියවා කෙනෙකුට රසයක් ලැබිය හැකි ය. එහෙත් එය සාහිත්‍ය රසයක් පමණක් මිස නාට්‍ය රසයක් නොවේ. නාට්‍ය පෙළකින් නාට්‍ය රසයක් ලැබිය හැක්කේ ඉහත නිර්වචනයේ පරිදි එය රංග භූමියක් මත රඟ දැක්වෙන මොහොතේ පමණි. එබැවින් නාට්‍ය පිටපතක් හෝ පෙළක් යනු රංග කාර්යය සඳහා අධ්‍යක්ෂවරයාට, රංගන ශිල්පීන්ට අවශ්‍ය කරන කරුණු ඇතුළත් අත්පොතක් ලෙස ද හැඳින්විය හැකි ය.

නවකතා හෝ කෙටිකතා රචකයා සියල්ල විස්තර කරනුයේ වචන මාර්ගයෙනි. ඔහුගේ ප්‍රකාශන මාධ්‍යය වන්නේ වචනවලින් සැදුම්ලත් වාක්‍ය වේ. ඇතැම් තැනෙක සංවාද යොදා ගත්ත ද ඔහු චරිත ගොඩනගන්නේ වචන භාවිතයෙන් කරන විස්තර මාර්ගයෙනි. එහෙත් නාට්‍ය රචනාවක සියලු සිදුවීම් එය සිදු වූ ආකාරයෙන් ම එයට මුහුණ දුන් පුද්ගලයන්ගේ මුවට නංවන සංවාද ඇසුරින් ගොඩ නැගේ. සංවාද භාවිත නොකෙරෙන සිදුවීම් නාට්‍යයක ඉදිරිපත් කිරීමේ දී ඒවා රචනා කෙරෙනුයේ නවකතාකරුවා මෙන්

සිදුවීම විස්තර කිරීමෙන් නොව එම අවස්ථාව රංගනය කිරීම උදෙසා රංගන ශිල්පියාට අවබෝධයක් ඇතිවන පරිද්දෙනි. ඒවා රංග විධාන ලෙස නාට්‍ය රචනයේ දී හැඳින්වේ. ඒ අනුව නාට්‍ය පිටපතක ඇතුළත් වන්නේ සංවාද හා රංග විධාන පමණකි.

නවකතාවක කෙටිකතාවක ඇතැම් විට කාව්‍ය රචනාවක කතන්දරයක් කියැවේ. එයින් සිදු වූයේ කුමක් ද යන්න පැහැදිලි කෙරේ.

එහෙත් නාට්‍යයක් නරඹන්නට ප්‍රේක්ෂකයා පැමිණෙන්නේ සිදු වූයේ කුමක් ද යන්න දැන ගැනිමට නොව එය සිදු වූයේ කෙසේ ද යන්න දැක ගැනීමට ය. සාමාන්‍ය ජීවිතයේ මෙන් කටට එන සියල්ල නාට්‍ය සංවාද මගින් පැවසිය නොහැකි ය. කාව්‍යමය ගුණය රැකෙන පරිදි එය රචනා කළ යුතු ය. එහෙත් නාට්‍යය යනු ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වන බැවින් එය දෘශ්‍ය කාව්‍ය ලෙස ද හැඳින්වේ.

මේ සියලු කරුණු සැලකිල්ලට ගෙන නාට්‍ය රචනාවක් කර ගන්නට අපි දැන් උත්සාහ කරමු. ඕනෑ ම කතාවක් හෝ සිදුවීමක් නාට්‍යයකට සුදුසු නොවේ. නාට්‍යයක ප්‍රධාන ලක්ෂණය වන්නේ ගැටුම ය. "නාටකීය ගුණය යනු ගැටුම යි."

**සැබෑ මුහුණ ද වෙස් මුහුණ ද** ග්‍රන්ථයේ එදිරිවීර සරච්චන්ද්‍රයන් නාට්‍යමය අවස්ථාවක් යන්න විග්‍රහ කරන්නේ උස් කඳු මුදුනක තබා තිබෙන ගලක් මෙන් බව යි. එය කොයි මොහොතේ කොයි අතට පෙරළේ දැයි කිව නොහැකි ය. ප්‍රේක්ෂකයා තුළ නාටකීය ආතතියක් හා කුතුහලයක් ගොඩ නැගිය හැක්කේ එවිට පමණකි. එසේ කුතුහලය ගොඩ නැගෙන පරිද්දෙන් නාට්‍යයේ එන සිදුවීම් පෙළ ගැස්විය යුතු ය. එය කතා වින්‍යාසය නම් වේ. කතා වින්‍යාසය මගින් චරිත හා චරිත අතර ගැටුම් තුළින් නාට්‍යයක් ගොඩ නැගේ.

මේ අනුව නාට්‍ය රචනයේ දී වැදගත් වන ප්‍රධානතම කරුණ වන්නේ ගැටුම් සහිත සිදුවීම් මාලාවක් අන්තර්ගත කතාවක් තෝරා ගැනීම හා එය නාට්‍ය රසය ඉස්මතු වන පරිදි වින්‍යාස ගත කිරීම වේ.

නාට්‍යයක් රචනා කිරීමේ දී රංග ශෛලිය ඉතා වැදගත් වේ. නාට්‍යයක් රචනය කළ යුත්තේ කුමන හෝ රංග ශෛලියක් පදනම් කර ගෙන යි. භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී යනුවෙන් මූලික රංග ශෛලීන් හෙවත් රංග ආකෘතීන් දෙකක් හඳුන්වා දී ඇත.

1. ලෝක ධර්මී

ලෝකයේ පැවැත්ම ඒ ආකාරයෙන් ම අනුකරණය කරන නාට්‍ය වේ.

2. නාට්‍ය ධර්මී

නර්තනය, ගායනය වැනි අංග භාවිතයෙන් ප්‍රාසංගික ගුණයෙන් වඩාත් පෝෂණය කළ ශෛලියකට අනුව ක්‍රියා අනුකරණය කරමින් ඉදිරිපත් කරන නාට්‍ය වේ. මෙය ශෛලිගත නාට්‍ය යනුවෙන් ද හැඳින්වේ.

වර්තමානයේ මේ මූලික ප්‍රභේදයන්ට අමතරව දේශීය සාම්ප්‍රදායික, ස්වභාවික සංවාද, අභූත රූපී ආදි විවිධ රංග ශෛලීන් පදනම් කර ගෙන නාට්‍ය රචනා කෙරෙයි.

නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කෙරෙනුයේ සතර අභිනය මාර්ගයෙනි.

වාචික, ආංගික, සාත්වික, ආහාර්ය යන මේ සිවු වැදෑරුම් අභිනයන්ගෙන් නාට්‍ය රචනයේ දී වැදගත් වන්නේ වාචික අභිනය යි. සෙසු අභිනයන් රංග කාර්යයේ දී යොදා ගනී. එහෙත් එම අභිනයන් යොදා ගැනීමට හැකි වන පරිදි උපදෙස් හා ඉඟි නාට්‍ය රචනයේ දී රචකයා දක්වා තිබිය යුතු ය. බොහෝ දුරට එම උපදෙස් ඇතුළත් වන්නේ රංග විධානයන් තුළ ය.

සෑම කලා කෘතියක ම ප්‍රධාන අරමුණ රස නිෂ්පත්තිය යි. එැවින් නාට්‍ය රචකයා ද අවසානයේ දී ප්‍රේක්ෂකයා තුළ රස ජනනය වන පරිද්දෙන් නාට්‍යය රචනා කළ යුතු ය.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **සරල තේමාවක් තෝරා ගෙන කෙටි නාට්‍යයක් රචනා කරන්න.**
2. **පන්තියේ යහළුවන් සමග සාමූහිකව නාට්‍ය පෙළෙහි අඩංගු කරුණු හා දෙබස් රඟපෑමට පුහුණු වන්න.**
3. **පන්ති රැස්වීමේ දී ඔබ රචනා කළ නාට්‍යය රඟ දක්වා, වින්දනයක් ලබන්න.**